NALANDA VIDYALAYA

නාලන්දා විද්‍යාලය - කොළඹ 10

දෙවන වාරය - ඒකක පරීක්ෂණ ව්‍යාපෘතිය

8 ශ්‍රේණිය	විද්‍යාව	7 පාඩම - ධාරා විද්‍යුතය පිළිබඳ මිනුම්

නිවැරදි පිළිතුර තෝරා ඉරක් අඳින්න.

1) විද්‍යුත් ධාරාව මනින සම්මත ඒකකය
   1) වෝල්ට් ය. 2) ඇම්පියර් ය. 3) වොට් ය. 4) ඕම් ය.

2) මෙම පරිපථ සටහනෙහි A, B, C පිළිවෙලින් දැක්වෙන්නේ,
   1) ස්විච්චය, වියළි කෝෂ, බල්බය
   2) ස්විච්චය, බල්බය, වියළි කෝෂ
   3) බල්බය, වියළි කෝෂ, ස්විච්චය
   4) බල්බය, ස්විච්චය, වියළි කෝෂ



3) පහත ප්‍රකාශ අතරින් නිවැරදි වන්නේ,
   a) විද්‍යුත් ධාරාව ගැලීමට නිශ්චිත දිශාවක් ඇත.
   b) ධාරාව ගලන සම්මත දිශාව වනුයේ සෘණ අග්‍රයේ සිට ධන අග්‍රය දක්වාය.
   1) a පමණි 2) b පමණි 3) a හා b පමණි 4) a හා b පමණි

4) විභව අන්තරය මැනීමට භාවිතා කරන උපකරණය වනුයේ,
   1) ඇමීටරය 2) වෝල්ට්මීටරය 3) ඕම්මීටරය 4) මිලි ඇමීටරය

5) ප්‍රතිරෝධය යනු
   I. සන්නායකයක් තුළින් ගලන ධාරාවකි.
   II. විභවය වැඩි ස්ථානයක සිට විභවය අඩු ස්ථානයකට ධාරාව ගලා යාම.
   III. සන්නායකයක තුළින් ගලන ධාරාව කෙරෙහි ඒ මගින් ඇති කරන බාධාව.
   IV. ඉහත කිසිවක් නොවේ.

6) ——/\/\/\/—— මෙම සංකේතයෙන් දැක්වෙන්නේ,
   1) බල්බයකි 2) ප්‍රතිරෝධයකි 3) ධාරිත්‍රකයකි 4) ඩයෝඩයකි

7) බහුලව භාවිත කරන වියළි කෝෂයක විභව අන්තරය කොපමණ ද?
   1) 1.5 V 2) 3 V 3) 9V 4) 12 V

8) බොහෝ අවස්ථාවල ඇමීටරයේ ධන අගය .... වර්ණ ගන්වා ඇත.
   1) කළු 2) කොළ 3) දුඹුරු 4) රතු

9) මෙම පරිපථයේ C වලින් දැක්වෙන්නේ
   1) බල්බයකි 2) ප්‍රතිරෝධයකි.
   3) ඇමීටරයකි 4) වෝල්ට්මීටරයකි



10) ඉහත පරිපථ සටහනේ වැරදියට සවිකර ඇති උපාංගය වන්නේ,
   1) D 2) C 3) B 4) A

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk

පහත උපාංග වල සංකේත නිවැරදිව තෝරා ලියන්න.

i)	වෝල්ට් මීටරය	....	a)	
ii)	ඇමීටරය	....	b)	
iii)	ප්‍රතිරෝධය	....	c)	
iv)	ධාරිත්‍රකය	....	d)	
v)	බල්බය	....	e)	

කෙටි පිළිතුරු ලියන්න.

1) A) I) බල්බයක්, වයර්, වියලි කෝෂ 2ක්, ඇමීටරයක්, වෝල්ට් මීටරයක් සපයා ඇත. මේවා ආධාරයෙන් බල්බයේ විභව අන්තරය හා ඒ හරහා ගලන ධාරාව මැනීමට සුදුසු පරිපථ සටහනක් අඳින්න. (සංකේත භාවිතයෙන්)

II) පරිපථයකට වෝල්ට්මීටරය හා ඇමීටරය සවි කරන්නේ කුමන ආකාරයට ද?

III) බල්බය තුළින් ගලන ධාරාව අඩු කිරීමට භාවිතා කළ හැකි උපාංගය කුමක් ද?

B) I) බහුලව භාවිතා වන විදුලි කෝෂ වර්ග 3ක් නම්කර එහි වෝල්ටීයතාව සටහන් කරන්න.

II) ධාරාවේ හා විභවයේ නිවැරදි මිනුම් ලබා ගැනීම අවශ්‍ය වන අවස්ථා 2ක් ලියන්න.

III) විවිධ ලෝහ වර්ග භාවිතා කිරීමේ දී පරිපථය හරහා ගලන ධාරාව වෙනස් වන බව පෙන්වීමට ක්‍රියාකාරකමක් කෙටියෙන් සඳහන් කරන්න.

IV) බොහෝ පරිපථවල ප්‍රතිරෝධකවල අගය සටහන් කර ඇත්තේ කුමන ක්‍රමයට ද?

එච්.එම්.ඩී.ටී.ජී. හඳපාන්ගොඩ

Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!

agaram.lk

agaram.lk